




# සිරිලක සමනලුන් සඳහා නම් වැල හා සබැඳි වදන්

හිමේෂ් දිල්රුවන් ජයසිංහ

# පිවිසුම

- සිංහල නම් වැලක අවැසියාව


- එක් එක් රටාසමයා වෙන් කර දැක්වීමට සිංහල බසේ, පෙර පටන් පැවත එන නම් නොතිබුණි.

- ඉංගිරිසියෙහි ද, පසු කාලීනව නම් යෙදූ බැවින් ඒ සඳහා වෙනත් නම් ඇසුරු කරගන්නා ලදී.

| පුද්ගල හා තනතුරු නාම | වෙනත් සතුන්ගේ නම් |
|---|---|
| Baron | Tiger |
| Admiral | Crow |
| Baronet | Albatross |
| Forester | Leopard |
| Pierrot | Gull |
| Soldier | Puffin |


# පිවිසුම

- සමනලුන් පිළිබඳව මව් බසින් ලිවීමට ඇරයුම් ලැබීම
- සමනලුන් සඳහා පළමු සිංහල නම් වැල - ලක්ෂ්මන් වීරතුංග, 2006





පැවති නම් වැලේ අඩුපාඩු රැසක් හඳුනා ගැනුණි.

# පිළිබැඳියාව




**ශ්‍රී ලංකාවේ කුරුල්ලන් සඳහා ක්‍රමානුකූල නාමාවලිය**


පෙරේරා ඩී. ජී. ඒ. සහ කොටගම, සරත්. 1983





**සිරිලක ගස්කොළන් අත්පොත**

ඇෂ්ටන්, මාර්ක්. සහ තවත් අය, 2004

# පිළිබැඳියාව




සිංහලයෙන් සිප්යුරු වදන්
ද සිල්වා, ජූලියන්. 2002




භාෂාවක භාවිතය හා විග්‍රහය
දිසානායක, ජේ. බී. 2007

- රජයෙන් සකස් කළ "පාරිභාෂික ශබ්ද මාලාව" සකු බස ගුරු කර ගත් නිසා බොහෝ වැරදි හා අඩුපාඩු වලින් යුතුය.

- සිංහළ බස සකු බසින් උපන්නා යැයි වැරදි මතයකට එළඹීම නිසා මෙම වරද සිදු විය.

- සිංහළ බස වෙනම ආරක් ගන්නා නිසා, අළුත් වදන් තැනීමට හෙළ බසම ගුරු කර ගත යුතුයි

- එසේ නොවුනහොත් මෙවැනි වැරදි හා අඩු පාඩු සිදු වේ.
  - වැරදි අර්ථයක් ලැබීම
  - අපේ ඌරුවට නොගැලපීම
  - වචන අනවැසි ලෙස දිගු වීම
  - එක් වදන් මුලයකින් ඉපදෙන වෙනත් වදන් තැනීමට නොහැකි වීම

මෙ සේ පැරණි සිංහළ භාෂාව කවර ප්‍රාකෘතයක් හා සංසන්දනය කර බැලූවත්, ධර්මාශෝක මහිපාලයන් ඉන්දියාවේ නොයෙක් දිග්භාගයන් හි ප්‍රචලිත භාෂාවන්ට අනුරූප වන පරිද්දෙන් පිහිටුවාලූ සෙල්ලිපි වල භාෂාව හා සංසන්දනය කර බැලූවත්, හින්දු, වංග ආදි කවර නව ඉන්දු ආර්ය භාෂාවක් හා සංසන්දනය කර බැලූවත් සිංහළෙහි සංකීර්ණ ලක්ෂණ ඇති බවත් එය විශේෂ ලක්ෂණ පහළ කරමින් වෙනම සංවර්ධනය වී ඇති බවත් පෙනේ.

- ඩී. ඊ. හෙටිආරච්චි, ධම්පියා අටුවා ගැටපද සංස්කරණයේ පෙරවදන

ජනාන්ච වාක් සුධා සූතිර් මණි සූතිශ්ච රොහණං
නාන්‍යත්‍ර සිංහලද්වීපාන් මුක්තා සූතිශ්ච සාගරං

අමාව සේ සුසුදු බස් වහර ද, රුහුණෙන් ඉපැදෙන මැණික් ද, මුතු සපයන මුහුද ද ඇත්තේ සිංහළ රටෙහි මිසැ අන් කවර තැනෙහි ද?

- රාජසේකර, බාලරාමායණය

| සකු වදන | සිංහල වදන |
|---|---|
| ප්‍රාතිහාර්‍යය | පෙළහර |
| විද්‍යුල්ලතාව | විදුලිය |
| වෘක්ෂය | ගස |
| මත්ස්‍යා | මාළුවා |
| ආශ්චර්‍යය | අසිරිය |
| පාඨශාලාව | පාසල |
| ප්‍රවෘත්තිය | පුවත |
| අස්ථිපඤ්ජරය | ඇටසැකිල්ල |

| ඉංගිරිසි වදන | සකු බස අනුව සිංහළ වදන |
| --- | --- |
| Reservoir | ජලාශය |
| Hydro reservoir | ජල ජලාශය |
| Oil reservoir | තෙල් ජලාශය |
| Reservation | ජලාශ කිරීම |
| Reserve (verb) | ? |

රැස් + කුරු = රැස්කුරු = රැස්යුරු - රැස්යුරයි




| ඉංගිරිසි වදන | සිංහළ වදන |
| --- | --- |
| Reserve (verb) | රැස්යුරයි |
| Reservoir | රැස්යුරුව |
| Hydro reservoir | දිය රැස්යුරුව |
| Oil reservoir | තෙල් රැස්යුරුව |
| Reservation | රැස්යුරුවම |

BCSSL

# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

1. බොහෝ සෙයින් එකයුරු ගතිසොබාව ඇති සමනල රටාසමයන්ට බොහෝ සෙයින් වෙනස් නම් යෙදීම

Crimson Rose - අරුණු සෙව්වන්දියා
Sri Lankan Rose - ශ්‍රී ලංකා රෝස පැපිලියා
Common Rose – සෙව්වන්දියා

# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

2. බොහෝ සෙයින් වෙනස් ගතිසොබාව ඇති සමනල රටාසමයන්ට බොහෝ සෙයින් එකයුරු නම් යෙදීම.

Stripped Albatross - ඉරි සුදනා
Little Orange Tip - හීන් සුදනා





ඉහත කාරණා දෙක නිසා නිරීක්සන්නෙකුට සමනලුන් එකිනෙකා වෙන් කර හඳුනා ගැනීමේදී හා මතක තබා ගැනීමේදී ගැටළු මතු කරවයි.

# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

3. අනවැසි ලෙස බොහෝ සෙයින් දික් වූ නම් යෙදීම.


Sri Lankan Birdwing - ශ්‍රී ලංකා මහ කුරුළු පිය පැපිලියා



# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

4. සතුන්ගේ හැඩලකුව වැරදි ලෙස විස්තර කරන නම් යෙදීම.

Crimson Rose - අරුණු සෙව්වන්දියා
Blank Swift - කළු පැහැ සැරියා





# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

5. එක් එක් සමනලයාට කිසිම සබඳකමක් නැති පද, නම් යෙදීමට ඇදා ගැනීම.

Common Bluebottle - නීල බෝමී
Plains Cupid - මීවන සරා





# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

6. සමනලුන්ගේ පැතිරියාව හා විසුම්පොළ වැරදි ලෙස විස්තර කරන නම් යෙදීම

Plain Puffin - දුම්බර-සුදනා
Common Castor - පොදු පතන්-සැරියා





# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

7. ඉංගිරිසි පද සිංහලට පෙරලීමේදී වැරදි ලෙස අරුත් ගැන්වෙන නම් යෙදීම.

Common Albatross - **දිඟුපත්** සමනලයා
Lemon Emigrant - **දෙහි** සැරියා





# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

8. වෙනත් අයුරක් තිබියදීත්, විදුහුරු නම සමනලයා හඳුනා ගැනීමට උපකාරයක් නොවන පරිදි සිංහල නමට යෙදීම.

Small Grass Yellow - රැබෙල්ලා තෘණ පීතයා
Tawny Coster - වියෝලා





# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

9. හැදුනුම් හැඩලකුව එකයුරුව යෙදීමට හැකියාව තිබියදීත් එය වෙනස් අයුරින් ලිවීම.

Spotless Grass Yellow – නොතිත් තෘණ-පීතයා
Three Spot Grass Yellow - තුන් පුල්ලි තෘණ-පීතයා





# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

10. වෙනත් සතුන්ගේ නම් වැරදි ලෙස අරුත් ගැන්වෙන අයුරින් ලිවීම.

Dark Blue Tiger - අඳුරුවන් නිල්-කොටිතියා





# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

11. පවතින පොදු පිළිගැනීම අනුව යම් රටකට තැන්වැති සතුන් පමණක් හැඳින්වීමට එම රටේ දේශපාලන නම යොදා ගැනුණ ද, එම පිළිගැනීම නොසලකා හැර තිබීම.

Ceylon Lace Wing - ලංකා සේද-පියාපතා (ලංකාවට තැන්වැති නොවේ.)
Indian Fritillary - ඉන්දියානු අලංකාරිකයා (ඉන්දියාවට තැන්වැති නොවේ.)





# පැවති නම් වැලේ අඩුපාඩු වර්ග

12. උච්චාරණයට අපහසු නම් යෙදීම.

Indian Sunbeam - **විස්මි-කීටා**





# අළුත් නම් වැල තැනුණු පිළිවෙල

සිංහල පොදු නමේ මූලික කොටස් දෙකකි

සුලබ සෙව්වන්දියා




මුල් පදය

අග පදය

# අළුත් නම් වැල තැනුණු පිළිවෙල

1. පොදුවේ එකයුරු හැඩලකුව ඇති සතුන් නම් කිරීමේදී අග පදය සඳහා පොදු නමක් යොදා ගැනුණි

Crimson Rose - දිලිරත් සෙව්වන්දියා
Sri Lankan Rose - ශ්‍රී ලංකා සෙව්වන්දියා
Common Rose - සුලබ සෙව්වන්දියා






# අළුත් නම් වැල තැනුණු පිළිවෙල

3 එකිනෙකට බොහෝ සෙයින් සමාන හැඩලකුව ඇති සතුන් එකිනෙකාගෙන් වෙන් කර දැක්වීම මුල් පදයෙන් සිදු කෙරුණි. මේ සඳහා එකිනෙකාගේ වෙසෙස් හැඩලකුව, බෙහෙවියාව, පැතිරියාව, විසුම්පොළ, හුරුසිරිත ආදිය සැලකිල්ලට ගැනුණි.

Common Pierrot - සුලබ ගෝමර-නීලයා
Banded Blue Pierrot - නිල්පටි ගෝමර-නීලයා
Angled Pierrot - කැළෑ ගෝමර-නීලයා





BCSSL

# අළුත් නම් වැල තැනුණු පිළිවෙල

4. ඒකයුරු හැඩලකුව ඇති සතුන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් නොමැති විට, නම අග පදයට පමණක් සීමා කරන ලදී.

Psyche – මනහාරි



# අළුත් නම් වැල තැනුණු පිළිවෙල

5. අග පදය හෝ මුල් පදය සඳහා වචන දෙකක් යෙදෙන විට ඒවා “-” සලකුණෙන් එකතු කෙරුණි.

Orange-Tailed Awl - රඹ-අගිස් බඩිල්ලා
Mottled Emigrant - ලපවන් පිමි-සැරියා




BCSSL

# අළුත් නම් වැල තැනුණු පිළිවෙල

6. ගණ නම එකම වුවත් එකිනෙකට වෙනස් කාණ්ඩ වලට වෙන් කර හඳුනා ගැනීමට හැඩලකුවක් පවතී නම් එය හැඳින්වීමට මැද පදයක් යොදා ගැනුණි.

Pale Four Lineblue - සුදුමැලි **සිව්** ඉරි-නීලයා
Rounded Six Lineblue - වටකුරු **සය** ඉරි-නීලයා





# අළුත් නම් වැල තැනුණු පිළිවෙල

7. එකම ගණයේ ශ්‍රී ලංකාවට තැන්වැති සතුන් දෙදෙනෙකු සිටින විට ද වෙන් කර දැක්වීමට මැද පදයක් යොදා ගැනුණි.

Sri Lankan Clouded Silverline - ශ්‍රී ලංකා උතුරු රිදී-නීලයා
Sri Lankan Green's Silverline - ශ්‍රී ලංකා කළුකර රිදී-නීලයා





# අළුත් නම් වැල තැනුණු පිළිවෙල

8. මුල් පදය සැම විටම අරුත් ගැන්වෙන අයුරු සකසන ලදී. බොහෝ විට අග පදය ද සිංහලෙන් අරුත් ගැන්වෙන අයුරු සැකසුවත් ඇතැම් විට විදුහුරු නම හෝ ඉංගිරිසි නම සිංහල උච්චාරණයට ගැලපෙන අයුරු සකස් කර යොදා ගැනුණි.

Banded Peacock - මයුර පැපිලියා (*Papilio* යන විදුහුරු නමින්)
Common Cerulean - සුලබ සෙරුලියා (Cerulean යන ඉංගිරිසි නමින්)





# නම් වැල අරුත් ගැන්වීම - පොදුවේ යොදන මුල් පද

1. පැතිරියාව හා විසුම්පොළ අනුව

| | |
|---|---|
| නිවර්තන | - ලෝකයේ නිවර්තන කළාපයේ පැතිරුණු |
| ශ්‍රී ලංකා | - ශ්‍රී ලංකාවට තැන්වැති |
| උතුරු | - ලක් දිව උතුරු කොටසේ වාසය කරන |
| කඳුකර | - කඳුකරයේ (දළ වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර 1000 ට වඩා උස පෙදෙස්) වාසය කරන |
| උප-කඳුකර | - උප කඳුකරයේ (දළ වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර 500 ත් 1000 ත් අතර උස පෙදෙස්) වාසය කරන |
| පහතරට | - පහත රට (දළ වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර 500 ට වඩා පහත් පෙදෙස්) වාසය කරන |
| කැළෑ | - කැළෑ වලට සීමා වූ හෝ කැළෑවල විසුමට වැඩි කැමැත්තක් ඇති |

# නම් වැල අරුත් ගැන්වීම - පොදුවේ යොදන මුල් පද

2. පැහැය අනුව

| | |
|---|---|
| දිලිරත් | - Crimson |
| රන්වන්, රන් | - (නොදිලි) රන් පැහැති |
| බොර, දුඹුරුවන් | - Brown, Brownish |
| රජත | - silver color |
| එළ | - White, pale |
| කහ, කහවන්, පීත | - Yellow |
| රඹවන් | - තැඹිලි පැහැති - Orange |
| පඬුවන් | - කහ පැහැයට හුරු තැඹිලි පැහැය |
| තඹලවන් | - Chestnut |
| ලෝහිත | - red |

# නම් වැල අරුත් ගැන්වීම - පොදුවේ යොදන මුල් පද

3. තරම අනුව

| | | |
|---|---|---|
| ටිකිරි, හිච්චි | - | තරමෙන් ඉතා කුඩා |
| හීන් | - | තරමෙන් කුඩා |
| මහ, රාජ, රජ, යෝධ | - | තරමෙන් ලොකු |

4. බෙහෙවියාව අනුව

| | | |
|---|---|---|
| සුලබ | - | බොහෝ සෙයින් දක්නට ලැබෙන |
| දුලබ | - | අඩුවෙන් දක්නට ලැබෙන |

BCSSL

# සියොත්වැන්නා

සියොත් + වැනි + ආ - කුරුල්ලෙකු අයුරු - මෙම සමනලයා ගේ පියාපත්, කුඩා කුරුල්ලේකුගේ තරම් ලොකු ය.



# සෙව්වන්දියා

සෙව්වන්දියා - සෙව්වන්දි + ආ - සෙව්වන්දි අයුරු - රෝස මල අයුරු - මෙම සමනලුන්ගේ පියාපත් වල රටාව රෝස පැහැය මුල් කරගෙන පවති යි.



# ජවසැරියා

ජවසැරියා - ජව + සැරි + ආ - වේගවත් පියාසැරියක් ඇත්තා



පෙඳැති ජවසැරියා



සුලබ ජවසැරියා



නිල් ජවසැරියා

# පිළිල-රිසියා, පිළිල-රිසිවැන්නා

පිළිල-රිසියා - පිළිල + රිසි + ආ - පිළිල + (කෑමට) කැමති + සතා - දළඹු අවදියේ දී පිළිල කොළ කන සතා

පිළිල-රිසිවැන්නා - පිළිල + රිසි + වැන්නා - පැහැ රටාවෙන් බොහෝ සෙයින් පිළිල-රිසියාට සමාන සතා



පිළිල-රිසියා



පිළිල-රිසිවැන්නා

# පිම්සැරියා

පිම්සැරියා - පිම් + සැරි + ආ - පිනුම් ගසන අයුරු පියාසැරිය ඇත්තා



ලපවන් පිම්සැරියා



කහවන් පිම්සැරියා



දෙපැහැ පිම්සැරියා

# තෘණ-පීතයා

තෘණ-පීතයා - තෘණ + පීත + ආ - තණකොළ ඇසුරේ (බිම් මට්ටමේ) දිවි ගෙවන බැවින් 'තෘණ' පදයත්, කහ පාට ඇත්තා යන අරුත ඇති 'පීතයා' පදයත් එක් කොට තැනුණි.



නොතිත් තෘණ-පීතයා



හීන් තෘණ-පීතයා



තෙතිත් තෘණ-පීතයා

# ගෝමරා

ගෝමරා - ගෝමර + ආ - (පැහැදිලි ව වෙනස පෙනෙන) පැහැ දෙකකින් රටා ගැන්වුණු සතා

නීල-පළිඟු - නීල + පළිඟු - ඉදිරි පියාපතේ සලකුණු නිල් පැහැයෙනුත් පසු පියාපතේ සලකුණු පළිඟු (සුදට හුරු) පැහැයෙනුත් යුතු

පළිඟු - පියාපත් වල සලකුණු පළිඟු (සුදට හුරු) පැහැයෙන් යුතු



නීල-පළිඟු ගෝමරා



පළිඟු ගෝමරා

# ගෝමරා

නීල - පියාපත් වල සලකුණු නිල් පැහැයෙන් යුතු

කාක-නීල - කාක + නීල - පියාපත් වල පසුබිම් පැහැය තද කළු පැහැයෙනුත් සලකුණු වල පැහැය නිල් පැහැයෙනුත් යුතු



නීල ගෝමරා



කාක-නීල ගෝමරා

BCSSL

# සඳැසියා

සඳැසියා - සඳැස + ඇති + ආ - සඳැස ඇති තැනැත්තා - සඳැස යනු මොණරා ගේ පිල් කළඹේ කෙළවර ඇති නෙක පැහැ රවුම් වලින් සැදි සලකුණ යි.



මයුර සඳැසියා



බිමැසුරු සඳැසියා



නීල සඳැසියා

# විදුරැසියා

විදුරැසියා - විදුර (දියමන්ති) + ඇස් + ඇති + ආ - දියමන්ති වැනි (සුදු පැහැ නමුත් එක් ඇලයකට පමණක් නිල් පැහැයෙන් දිලෙන) ඇස් වැනි රවුම් සලකුණු ඇති තැනැත්තා



හීන් විදුරැසියා



මහ විදුරැසියා

# තුඩුනැමියා

තුඩුනැමියා - තුඩු + නැමි + ආ - වසා සිටින විට පියාපත් තුඩු පහළට නැමෙන සේ තබා සිටින සතා



# සිව්රැසියා, තුනැස්සා


සිව්රැසියා - සිව් + රැසි + ආ - හතරැස් (පසු පියාපතක්) ඇත්තා

තුනැස්සා - තුන් + ඇස් + ආ - පසු පියාපත බෙහෙවින් ත්‍රිකෝණාකාර සතා





# පියාපතේ කොටස් හා පියාපත සබැඳි වදන්





ඉදිරි පියාපත

පසු පියාපත

# පියාපතේ කොටස් හා පියාපත සබැඳි වදන්

Base - පාදම
Post base – පසු පාදම
Sub median – පෙර මැදිය
Median – මැදිය
Post median – අපර මැදිය
Sub margin – උප දාරය
Margin – දාරය
Apex – තුඩ
Sub apex - උප තුඩ




Sub costal vein – උප උඩු දාර නහරය
Median vein – මැදි නහරය
Sub median vein – උප මැදි නහරය

# දිවි සක (Life cycle) සබැඳි වදන්

Early stages – පෙරසැටිය - පෙර + සැටිය

Micropyle – බිජුදොර

Osmaterium – ගඳවිසිරුව - ගඳ + විසුරුව

Instar – අන්තරුව - අන්තර් + රුව

Larval food plants - දළඹුවන්ගේ ආහාර ගස් කොළන්

Wing bud - පියාපත් කොළොපුව

Labial palp – මුව නළ කොපුව

Proboscis - මුව නළය

Compound eye - ඇස් කැටිය

Spiracle – වා සිදුර

# කුලසිටුවීම (Classification)

රජදහන (Kingdom) :- සත් (Animalia)

වංශ (Phylum) :- සන්දිපාද (Arthropoda)

වර්ග (Class) :- කුරුසත් (Insecta)

ගෝත්‍ර (Order) - කාරමපත් (Lepidoptera)

උපරි කුලය (Super family) - දිවාසැරි (Papilionoidea)

කුලය (Family)

- ලිහිණිපෙඳ කුලය (Papilionidae)
- ස්වේතපිය කුලය (Pieridae)
- කෙටිපා කුලය (Nymphalidae)
- නීලලෝහිත කුලය (Lycaenidae)
- විවරපිය කුලය (Riodinidae)
- දිගුනළ කුලය (Hesperiidae)

BCSSL

# වෙනත් වදන්

Entomology - කුරුසත් විදුව - කෘමි සතුන් පිළිබඳ විද්‍යාව

Migration – දුරසැරිය - දුර + සැරිය

Metamorphism - බහුයුරුව - බහු + අයුරුව (දිවි සකේ එකිනෙකට වෙනස් අයුරක් ගන්නා අවස්ථා හතරක් පැවතීම මෙයින් අදහස් කෙරේ.)

Variation – වෙනසියාව

Seasonal form – කාලයුරුව - කාල + අයුරුව

Sexual dimorphism – ලිඟු ද්විරුවැතිය - ලිඟු ද්වි + රුව + ඇතිය


Polymorph - බහුරුවැතිය - බහු + රුව + ඇතිය (ඇතැම් සමනල රටාසමයන් සුහුඹුල් අවදියේ දී එකිනෙකට වෙනස් පැහැ රටාවක් සහිත රුවින් යුතු වීම මෙයින් අදහස් කෙරේ.)

Mud sipping - දියති ඉරීම - දිය + ඉති + ඉරීම

Mimicry - අනුයෑම - අනුව + යෑම

Adaptation - අනුහුරුව - අනුව + හුරු වීම

# වාරණ (2015, මැයි)




## සිරිලක සමනලුන් සඳහා නම් වැල හා සබැඳි වදන්


හිමේෂ් දිල්රුවන් ජයසිංහ
ශ්‍රී ලංකා සමනල සංරක්ෂණ සංසදය



**පිවිසුම**

මෙම නම් වැල තනන අවදියේ දී, සිරිලක සමනලුන් සඳහා සිංහළ නම් වැලක් කුමකට දැයි කිහිප දෙනෙකුම අසන්නට යෙදුණි. මම එහි අවැසියාව විදහා දැක්වීමට පහත සඳහන් කරුණු දෙක ඉදිරිපත් කරමි.


මා කුඩා කල සිටම සොබා දහම ගැන උනන්දු වීමට හුරු කළේ තාත්තා ය. මා පළමුවැරි පන්ති වල ඉගෙන ගන්නා සමයේ, සතියකට වරක් පමණ කිරිබත්ගොඩ පදික වෙළෙන්දෙකුගෙන් රූප කොළයක් අරන් දීම, ඔහු පුරුද්දක් කරගෙන සිටියේ ය. එම රූප කොළයේ ඇති රූප එකිනෙක කපා පොතක අලවා, රූප කොළයේ යටි පැත්තේ සඳහන් නම රූපයට පහළින් පොතේ ලිවීම මගේ රාජකාරිය විය. දිනක් මට සමනලුන්ගේ රූප කොළයක් ලැබුණි. අනෙක් කොළ වලදී මෙන්ම මම මෙහි ද පළමු රූපය කපා අලවා, එහි යටි පැත්තේ සඳහන් පරිදි "සමනලයා" යැයි ලිවෙමි. දෙවැනි රූපය ද කපා අලවා, එහි සඳහන් පරිදි "සමනලයා" යැයි ලිවෙමි. මෙලෙස, රූප කොළයේ එකිනෙකට වෙනස් සමනලුන් කොතෙකුත් සිටිය ද ඒ සැමටම "සමනලයා" යන එකම වදන ලිවෙමි. අවුරුදු 25 කට ත් වඩා පැරණි මෙම සිදු වීම දැනටත් මගේ මතකයේ පවතින්නේ, එහි යම් කිසි අඩු පාඩුවක් තිබූ බව දැනුනු බැවිනි.

සමනලුන් පිළිබඳව අප සමග පර්යේෂණ සිදු කරන සරත් රාජපක්ෂ අපට හමු වන්නේ විශ්ව විද්‍යාල අවදියේ දී ය. ඔහු නිතරම පවසන කරුණක් වන්නේ, "අප කොළඹ ආසන්නයේ සිටි බැවින්, කුඩා කළ සිටම සොබා දහම ක්‍රමාණුකූලව අධ්‍යනය කිරීම පිළිබඳව ඉගෙනීමක් ලැබීමට අවස්ථාවක් ලැබුණු මුත්, සොබා දහම ගැන දැඩි ඇල්මක් තිබුණු තමාට එවැනි ඉගෙනීමක් කුඩා කළ ලැබීමට අවස්ථාවක් නොලැබුණු බව ය." තමාගේ ම ගමේ පාසැල් ගුරුවරයෙකු වන ඔහු තවදුරටත් පවසන්නේ "සොබා දහම ගැන උනන්දුවක් දක්වන සිසුන් පිරිසක් පාසැලේ සිටියත් ඔවුන්ට ඒ පිළිබඳව කියා දීමට ඇති මූලික බාධාව වන්නේ ඉංග්‍රිසිය තේරුම් ගැනීමට ඇති අපහසුතාවය බවයි." ඔවුන්ට සමනලුන් පිළිබඳව කියා දීමට යාමේ දී මතු වන ගැටළුව වන්නේ ඒ සඳහා සුදුසු සිංහල වදන් නොමැති වීමයි.

සමනලුන් පිළිබඳව මව් බසින් ලියන්න යැයි අපගෙන් මුලින්ම ඉල්ලුවේ මහැඳුරු සරත් කොටගම ය. ඒ 'A pocket guide to the butterflies of Sri Lanka' පොත දොරට වැඩවූ දිනයේ දී ය. නැවත ද 'Common butterflies of Sri Lanka' පොත ලිවීමේ දී, එහි සමනලුන්ගේ සිංහල නම් ඇතුලත් කරන්න යැයි ඉල්ලීමක් කෙරුණි. ඒ වන විට පැවති නම් වැලේ බොහෝ සදොස් තැන් තිබූ නිසා එම පොතට සිංහල නම් ඇතුලත් නොකෙරුණු අතර එය ක්‍රමාණුකූල නම් වැලක් සැකසීම ඉක්මන් කිරීමට මඟ පාදන ලදී.

අප රටේ සමනලුන් වර්ග 246 ක් සිටිතත් ඔවුන් එකිනෙකා වෙන් කර හැඳින්වීමට, පෙර පටන් පැවත එන සිංහල නම් නොවිනි. ඉංග්‍රිසියෙහි ද මෙම අඩුපාඩුව තිබූ බව සිතිය හැක්කේ සමනලුන්ට නම් යෙදීමේදී වෙනත් සතුන්ගේ (කුරුල්ලන්, ක්ෂිරපායින් ආදීන් ගේ) නම් හා පුද්ගල තනතුරු නාම ඒවාට ඈදා ගැනීමෙනි. එබැවින් මෙලෙස යම් බසකින් මුලුමනින්ම අළුතෙන් නම් යෙදීම ඉතා අපහසු කටයුත්තකි. නමුත් ලක්ෂ්මන් වීරතුංග විසින් 2006 දී මෙම කටයුත්තට මුල පුරන ලදී. එම නම් වැල තරමක් දුරට පිරිපහදු කර 2012 රතු දත්ත වාර්තා පොතේ පළ කෙරුණි. එහෙත් මෙම නම් වැලේ ද අඩුපාඩු රැසක් පවති යි.

**පිළිබැඳියාව**

මෙම නම් වැල සැකසීමේ දී "ලංකාවේ කුරුල්ලන් සඳහා ක්‍රමානුකූල නාමාවලිය (පෙරේරා ඩී. පී. ඒ. සහ කොටගම, සරත්. 1983)" ගුරු කොට ගත් අතර "සිරිලක ගස්කොළන් අත්පොත (ඇෂ්ටන්, මාර්ක්. සහ තවත් අය, 2004)" සඳහා යොදා ගත් නම් වැල ද පිරික්සන ලදී. වදන් තැනීම සඳහා "සිංහළයෙන් සිප්යුරු වදන් (ද සිල්වා, ඊලියන්. 2002)" හා "භාෂාවක භාවිතය හා විග්‍රහය (දිසානායක, ජේ. බී. 2007)" ඇසුරු කර ගන්නා ලදී. "සිංහළයෙන් සිප්යුරු වදන්" හි දක්වා ඇති පරිදි රජයෙන් සම්මත කළ "පාරිභාෂික ශබ්ද මාලාවේ" ඇති සදොස් වචන සඳහා මෙම ලියමනේ දී හැකි තාක් දුරට අරුත් සහිත වචන යොදා ගන්නා ලදී.

# ස්තූතියි!